# මාධ්‍ය සේවක වෘත්තිය සමිති සම්මේලනය
# ஊடகத்துறை ஊழியர் தொழிற்சங்க சம்மேளனம்
# FEDERATION OF MEDIA EMPLOYEES' TRADE UNIONS

ලි.ප.අංකය: பதிவு இலக்கம் Reg.No. 6598 ☎ Fax. 2472407 Email - fmetu123@gmail.com

ලේක්හවුස් සේවක සංගම් කාර්යාලය
35,ඩී.ආර්.විජේවර්ධන මාවත,
ලේක් හවුස්,
කොළඹ 10.

லேக் ஹவுஸ் ஊழியர் சங்க காரியாலயம்,
இல. 35, டீ. ஆர். விஜேவர்தன மாவத்தை,
லேக் ஹவுஸ்,
கொழும்பு 10.

Lake House Employees' Union office
35, D.R.Wijewardane Mawatha,
Lake House,
Colombo 10.


**ජනමාධ්‍ය නිවේදනය**

**2018 නොවැම්බර් 25**

## ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන දේශපාලන අර්බුදය හා

## රාජ්‍ය - පුද්ගලික ජනමාධ්‍ය හැසිරීම, ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් නව අගමැතිවරයෙකු පත් කිරීම හා පාර්ලිමේන්තුව විසුරුවාහැර මහ මැතිවරණයක් කැඳවීමට ගත් උත්සාහය ශ්‍රී ලංකාව තුළ බරපතල සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුදයක ට හේතු වෙමින් පවතින බව මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය විශ්වාස කරනු ලබයි.

මේ අතර අණ්ඩුව විසුරුවා හැරීමට හා මැතිවරණයක් කැඳවීමට ජනාධිතිපතිවරයා විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගය මේ වනවිට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක්ව තිබේ.

රටතුළ අභියෝගයට පත්ව ඇති ආණ්ඩුවේ හා වර්තමාන පාර්ලිමේනතුවේ ක්‍රියාකාරීත්වය පොදුවේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට මෙන්ම මාධ්‍ය නිදහසට ද තර්ජනයක්ව පවතින බව අප රටේ බහුතර මාධ්‍ය සංවිධානයන්හී අදහස වී තිබෙන බව එම සංවිධානයන්හී නිවේදනයන් නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වේ.

පසුගිය දශකයේ මරා දැමූ ලසන්ත වික්‍රමතුංග හා අතුරුදහන් කළ, පහරකෑමට ලක්වූ මාධ්‍යවේදීන් පිළිබඳව හා තවත් බොහෝ අපරාධ සම්බන්ධයෙන් පවතින අධිකරණ විභාගයන්ට සහාය ලබාදෙනු වෙනුවට ඒවායෙහි පරීක්ෂණ කටයුතු සිදුකරන පොලිස් නිළධාරීන් සිය සේවා ස්ථානවලින් මාරුකිරීමට ආණ්ඩුව දරණ උත්සාහයන් ඇතුලු ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා මාර්ගයන් හෙළා දැකීමට ද අප සම්මේලනය පසුබට නොවේ.

මේ සියලු අභියෝගයන් මධ්‍යයේ ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය - පුද්ගලික මුද්‍රිත, විද්‍යුත් ගුවන් විදුලි මාධ්‍ය හැසිරීම පිළිබඳව ද අප සම්මේලනය ගැඹුරින් නිරීක්ෂණය කරමින් සිටි අතර ලංකාවේ රාජ්‍ය හා පුද්ගලික ජනමාධ්‍ය පාර්ශවීය හැසිරීම පිළිබඳව සිය බලවත් කනස්සල්ල පළකර සිටී. රටේ වර්තමාන දේශපාලන ව්‍යාකූළත්වයත් සමග එම තත්වය තවදුරටත් වර්ධනය වෙමින් පවතී.

ලෝක ජනමාධ්‍ය සමාජය විසින් ශිෂඨත්වය වෙනුවෙන් හඳුන්වාදී තිබෙන මූලික ජනමාධ්‍ය ආචාර ධර්මයන් කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ කර්තෘ සංසදය විසින් මුද්‍රිත මාධ්‍ය සඳහා හඳුන්වා දී තිබෙන තමන්ගේ ම වූ මාධ්‍ය ආචාර ධර්ම පද්ධතිය කෙරෙහි බොහෝ කර්තෘවරුන් පවා සැළකිල්ලක් නොදැක්වීම ඛේදයකි. විශේෂයෙන් ම කර්තෘ සංසදයේ ප්‍රධානීන් කර්තෘත්වය දරණ පුවත්පත්හී පාර්ශවීය හා ආචාර ධර්ම විරෝධී වාර්තාකරණයන් බහුලවීම පිළිබඳව මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය සිය කණගාටුව ප්‍රකාශ කර සිටී.

මෙම තත්වය පසුගිය දශක ගණනාවක් තිස්සේ හැඩගැසී තිබෙන ශ්‍රී ලංකාවේ රාජ්‍ය මාධ්‍යයන්හී ක්‍රියාකාරීත්වය හා එම ආයතන තුළ පවතින ඛේදනීය තත්වයෙහි දිගුවක් බව සටහන් කිරීමට මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය පසුබට නොවේ. ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 1973 දී රජය විසින් පවරා ගත් අවස්ථාවේ සිටම අද දක්වා ම පනත උල්ලංගනය කරමින් බලයට පත්වන රජයන්හී දේශපාලන හොරණෑව වනවා පමණක් නොව ඒ ඒ ආණ්ඩුවල දේශපාලන හෙන්චයියන්ගේ කෙලිබිමක් බවට පත්වීම අපගේ අත්දැකීම වේ.

රාජ්‍ය මාධ්‍ය ගණයට වැටෙන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහණී සේවය හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව යන ආයතනවල තත්වය ද එලෙසින් ම ඛේදනීය වේ.

මාධ්‍ය සේවක වෘත්තිය සමිති සම්මේලනය
ஊடகத்துறை ஊழியர் தொழிற்சங்க சம்மேளனம்
FEDERATION OF MEDIA EMPLOYEES' TRADE UNIONS
ලි.ප.අංකය: பதிவு இலக்கம் Reg.No. 6598 ☎ Fax. 2472407 Email - fmetu123@gmail.com

ලේක්හවුස් සේවක සංගම් කාර්යාලය
35,ඩී.ආර්.විජේවර්ධන මාවත,
ලේක් හවුස්,
කොළඹ 10.

லேக் ஹவுஸ் ஊழியர் சங்க காரியாலயம்,
இல. 35, டீ. ஆர். விஜேவர்தன மாவத்தை,
லேக் ஹவுஸ்,
கொழும்பு 10.

Lake House Employees' Union office
35, D.R.Wijewardane Mawatha,
Lake House,
Colombo 10.



ජනාධිපතිවරයා විසින් අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ඉවත්කොට මහින්ද රාජපක්ෂ මහතා අගමැති වශයෙන් පත්කළ ඔක්තොබර් 26 වෙනිදින රාත්‍රියේ මංගල සමරවීර මහතාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂයේ නායකයන් පිරිසක් රූපවාහිණී සංස්ථා ප්‍රවෘත්ති මැදිරියට ඇතුල්වී සිදුකළ කලබැගෑනියත්, අනතුරුව මහින්ද රාජපක්ෂ නායකත්වය දෙන පොදු ජන පෙරමුණේ කෙහෙලිය රඹුක්වැල්ල මහතා ප්‍රමුඛ පිරිසක් කඩා වැදී තමන්ගේ සහචරයන් ආයතනයේ මුල් පුටවල වඩාහිඳුවීමත් අප සම්මේලනය තරයේ හෙළාදකී. අද දවසේ මේ සියලු රාජ්‍ය මාධ්‍ය ආයතනයනහී  පරිපාලනය සහ මාධ්‍ය හැසිරවීම සිදුකරණුයේ මහින්ද පාර්ශවයේ පිරිස් විසින් බව සඳහන් කිරීමට ද පසුබට නොවෙමු.

රටක දේශපාලන අර්බුදයක දී රටේ ජනමාධ්‍ය පාර්ශවීයභාවයෙන් තොරව ස්වාධීනව සිය වාර්තාකරණයේ යෙදෙන්නේ නම් අර්බුදයට පිළියම් සොයැගැනීම පහසුවන බව විශ්වාස කරන අප සම්මේලනය එලෙස මධ්‍යස්ථ හැසිරීම මාධ්‍ය කර්මාන්තයේ වර්ධනය හා පැවත්මට ද හිතකර බව පවසා සිටී. දැනටමත් රටේ ජනතාවගෙන් බහුතරය මාධ්‍ය ආයතන හා මාධ්‍ය ප්‍රධානීන්ගේ හැසිරීම, ඔවුන්ගේ මාධ්‍ය භාවිතාව පිළිබඳව බරපතල විවේචනයක නියැලෙන බව රහසක් නොවන අතර ජනතාව ලංකාවේ ජනමාධ්‍ය පිළිබඳ විශ්වාසනීය භාවය ප්‍රශ්ණ කරමින් සිටී.

මෙවැනි විකෘත ජනමාධ්‍ය හැසිරීමේ වගකීමෙන් නිදහස් වෙන්නට ජනමාධ්‍යවේදීන්ට ද හැකියාවක් නොමැති බව සඳහන් කරන මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය වඩ වඩාත් සංවිධාන ගතවීම තුළ ජනමාධයවේදීන්ගේ ආරක්ෂාව, ජනමාධ්‍ය වෘත්තියේ, වෘත්තීය ගරුත්වය ආරක්ෂා කරගත හැකි බව අවධාරණය කරන අතර ජනමාධ්‍යවේදීන්ගෙන් බහුතර පිරිසකට සිය මූලික අයිතිවාසිකම් පිළිබඳව පවා නොසළකා හරින මාධ්‍ය ආයතන පිළිබඳව පවා මූලික අවධානයක් යොමුකර ගත හැක්කේ ජනමාධ්‍යවේදීනගේ සංවිධාන ශක්තිය මත බව අවධාරණයකර සිටී.

මෙයට, විශ්වාසී

**ධර්මසිරි ලංකාපේලි**
ප්‍රධාන ලේකම්
077 364 1111